*සැ. යු.* - 2022.05.20 දින පළ වූ අංක 2281 දරන *ගැසට් පත්‍රයේ* I:II(අ), II, III, IV(අ) IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,282 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | 152 |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 152 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 154 |


*සැ. යු.* - (i) විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

(ii) විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 මැයි මස 06 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජුනි මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චයන් ගැසට් පත්‍රයන්හි පළ කිරීම**

වරින්වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව මෙම කොමිෂන් සභාව වෙත ව්‍යවස්ථාපිත ප්‍රකාශන ඉදිරිපත් කර ඇති එහෙත් එකී පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත නිශ්චය *ගැසට් පත්‍රයේ* පළකර නොමැති තැනැත්තන් හෝ ඔවුන්ගේ උරුමකරුවන් තම හිමිකම හෝ උරුමය තහවුරු කෙරෙන ලේඛන සමග පහත ලිපිනයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් උපරිම සීමා අංශය වෙත වර්ෂ 2022 මැයි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම පැමිණෙන ලෙසට දන්වා සිටිමි.

නීතිඥ නිලන්ත විජේසිංහ,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2022 මැයි මස 10 වැනි දින,
අංක 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

05-223

---

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්/ ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ (19)4 උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995 අගෝස්තු මස 21 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/539 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ආගරපතන පදිංචි නාමබන්දු පින්නදූව මහතා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 21/440/95 අංකය යටතේ 1995.11.13 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.06.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුල පත්තුවේ / කෝරළේ 475/1, ආගරපතන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හෝල්බෲක් නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක මු.පි.නු. 1144 දරන පිඹුරේ රේඛා සටහනේ අංක 02 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.098 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අග්‍රා ඔය රක්ෂිතය, |
| *නැගෙනහිරට* | : | අග්‍රා ඔය රක්ෂිතය, |
| *දකුණට* | : | කැබලි අංක 07, |
| *බස්නාහිරට* | : | මාර්ග රක්ෂිතය. |

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2021 නොවැම්බර් මස 06 වැනි දින.

05 - 217/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995 නොවැම්බර් මස 30 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/744 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රත්නගිරිය ලැමලියර් වත්ත පදිංචි රණසිංහ පබිලිස් සෙනෙවිරත්න මහතා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/34/1615/96 අංකය යටතේ 1996.04.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.06.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුල කෝරළේ රත්නගිරිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ලැමලියර් වත්ත නැමැති ගමේ පිහිටා ඇත්තා වූද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් භාරයේ ඇති අංක දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක නුවි/81/89 දරන පිඹුරේ රේඛා සටහනේ 196 අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 පමණ විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, |
| *නැගෙනහිරට* | : | කට්ටි අංක 195, |
| *දකුණට* | : | එච්. එම්. ගේ ඉඩම, |
| *බස්නාහිරට* | : | මාර්ගය. |

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2021 දෙසැම්බර් මස 31 වැනි දින.

05 - 217/2

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1988 මාර්තු මස 25 වැනි දින ප්‍රදානය කර ඇති අංක නු/එ/ප්‍ර/5323 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ආගරපතන හෝල්බෲක් පදිංචි රතේපුරගේ හරමානිස් යන අය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ 6/551/88 අංකය යටතේ 1988 මැයි 09 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.06.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දිඹුල කෝරළේ 475/1, ආගරපතන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ආගරපනත නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක පි.පි.නු. 939 දරන පිඹුරේ අංක 31 අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.091 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, |
| *නැගෙනහිරට* | : | ප්‍රැන්කටන් වත්ත, |
| *දකුණට* | : | පි.පි.නු. 939 හි කැබලි අංක 27, |
| *බස්නාහිරට* | : | මාර්ගය. |

ඒ. ඒ. විදුල සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2021 දෙසැම්බර් මස 06 වැනි දින.

05 - 217/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඒ. ඒ. විදුර සම්පත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1995 මාර්තු මස 21 වැනි දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/නුඑ/448 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බංගලාහත, නුවරඑළිය පදිංචි සවුන්ද්‍ර හැන්නදිගේ විජයදාස මහතා වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නුඑ/23/151/95 අංකය යටතේ 1995.05.30දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීමට සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2022.06.17 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔය පළාත පත්තුවේ/ බංගලාහත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බංගලාහත නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක මු.පි.නු. 978 දරන කට්ටි කැඩීමේ පිඹුරේ 19 අංක දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.102 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මු.පි.නු. 978 සැලැස්මේ මාර්ගය, |
| *නැගෙනහිරට* | : | මු.පි.නු. 978 සැලැස්මේ මාර්ගය සහ කට්ටි අංක 21, |
| *දකුණට* | : | මු.පි.නු. 978 සැලැස්මේ කට්ටි අංක 21 සහ මාර්ග රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | මු.පි.නු. 978 සැලැස්මේ මාර්ග රක්ෂිතය. |

ඒ. ඒ. විදුර සම්පත්,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2020 ඔක්තෝබර් මස 19 වැනි දින.

05 - 217/4

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/63348.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය
:එන්සීපී/පීඑල්සී/එල්03/ටීඑල්/04.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 405, මොරගොඩ ග්‍රාම නිලධාරි වසමේ මොරගොඩ ගමේ බලයලත් මිනින්දෝරු විසින් සකසන ලද අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 03, රූඩ් 01, පර්. 4.7 ක් පමණ වූ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සිලෙක්ස් සෝලා පවර් තිරප්පනේ ප්‍රයිවට් ලිමිටඩ් විසින් ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | ආර්. ජී. කරුණාසේන මයා සහ එන්. එම්. සී. කුමාරිහාමි මිය හිමිකම් කියන ඉඩම් කැබලි, |
| *දකුණට* | : | විදුලි කම්බි මාර්ගය සහ රක්ෂිතය, |
| *බටහිරට* | : | මාර්ගය. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.02.16 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති /සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2022.02.16 දින සිට වසර 05ක් ගතවන තුරු පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2022 අප්‍රේල් මස 30 වැනි දින,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය, අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-219

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/43871.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්07/10/4/2.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 249, I පියවර, II කොටස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හරිස්චන්ද්‍ර මාවත ගමේ අ. න. පි. අ. 02 හි කැබලි අංක 1031 න් කොටසක් පෙන්වීමට අදින ලද දළ අනුරේඛණ අංක 2015/06 හි කැබලි අංක 01 දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0780 ක් පමණ වන රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සමස්ත ලංකා බෞද්ධ කාන්තා සම්මේලනය (අනුරාධපුර ශාඛාව) නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.න.පි.අ. 2 කැබලි අංක 806 සහ වැව පාර, |
| *නැගෙනහිරට* | : | වැවපාර සහ අ.න.පි.අ. 2 කැබලි අංක 1031 න් කොටසක්, |
| *දකුණට* | : | අ.න.පි.අ. 2 කැබලි අංක 1031න් කොටසක් සහ කැබලි අංක 813 , |
| *බටහිරට* | : | අ.න.පි.අ. 2 කැබලි අංක 813 සහ 806. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු පහ (05) යි, (2022.03.23 දින සිට වසර 05ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙකුත් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(ඊ) 2022.03.23 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(උ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
මිහිකත මැදුර,රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-220

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67885.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්07/10/04/02.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 239, වන්නිතම්මැන්නාව ග්‍රාම නිලධාරි වසමේ වන්නිතම්මැන්නාව ගමේ අනුරේඛණ අංක 2020/නැනුප/21 හි කැබලි අංක 01 පෙන්වීමට අදින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0177ක් සමිති කටයුතු සඳහා වන්නිතම්මැන්නාව අවමංගල්‍යාධාර සමිතිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගල්වල පිහිටි ඉඩම, |
| *නැගෙනහිරට* | : | සේපාලි මනම්පේරි පදිංචි ඉඩම, |
| *දකුණට* | : | එක්සත් මරණාධාර සමිති ශාලාව පිහිටි ඉඩම, |
| *බටහිරට* | : | මාර්ගය (ප්‍රාදේශීය සභා). |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු පහ (05) යි, (2022.01.21 දින සිට ඉදිරියට).
*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඉ) සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2022.01.21 දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

ගැසට් නිවේදනය පළ කරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2022 අප්‍රේල් මස 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
මිහිකත මැදුර,රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-221

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/68060.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය
:එන්සීපී/පීඑල්සී/එල්05/එම්ඩබ්/04/2021.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 371, නවෝදගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වන්නිහැළඹ වැව ගමේ අ. හූ. පි. 02, මධ්‍යම පාන්තික කට්ටි කැඩීමේ පිඹුරේ කැබලි අංක 331න් කොටසක් පෙන්වීමට සකසන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 10ක් පමණ වන රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා කපුරු බණ්ඩාගේ ධර්මදස මයා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

01. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : කැබලි අංක 323,
*නැගෙනහිරට* : තන්තිරිමලේ ප්‍රධාන පාර හා එහි රක්ෂිතය,
*දකුණට* : කැබලි අංක 332,
*බටහිරට* : කැබලි අංක 331න් කොටසක්.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.03.10 දින සිට වසර 30ක් ඉදිරියට).

*වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000)ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(ඊ)* 2022.03.10 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*.

2022 අප්‍රේල් මස 22 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

05-103

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.